රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 10/2018

මගේ අංකය : F/FR/03/BRCir.
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

2018.05.30

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,

**රජයේ ගොඩනැගිලි කුලී "20.02.01.01." සඳහා හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම- 2018.06.30**

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 01/2015 හා 2015.07.20 දිනැති චක්‍රලේඛයට ඔබගේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශ ලේකම් ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් කටයුතු කරනු ලබන ආදායම් සංකේතාංක **20.02.01.01** වන **රජයේ ගොඩනැගිලි කුලී** ආදායම් එකතු කිරීමේ වගකීම පැවරී ඇති ප්‍රධාන ගණන්දීමේ නිලධාරින් / ගණන්දීමේ නිලධාරින් විසින් මු.රෙ.128 (2) (ඇ) විධිවිධාන ප්‍රකාරව එකී ආදායම් සංකේතාංකයට අදාලව හය මසකට වරක් හිඟ ආදායම් පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව ඇත.

03. එබැවින් **20.02.01.01.** වන **රජයේ ගොඩනැගිලි කුලී** ආදායම් සංකේතාංක යටතේ නියමිත නීති සහ රෙගුලාසි ප්‍රකාරව නඩත්තු කරන ලද හිඟ ආදායම් සම්බන්ධ ගිණුම් පොත් නිසි පරිදි සංසන්දනය කර ඉහත සඳහන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 පරිදි අමුණා ඇති ආකෘති පත්‍ර අංක 01 ට අනුව 2018**.06.30** දිනට සකස් කරන ලද හිඟ ආදායම් වාර්තා **2018.07.12** දිනට පෙර "buildingrentpubad@gmail.com" යන විද්‍යුත් තැපැල් ලිපිනයට මෘදු පිටපතක්ද සහිතව මෙම අමාත්‍යාංශයෙහි **"ප්‍රධාන මූල්‍ය නිලධාරී"** වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. අදාළ දිනට හිඟ ආදායම් කිසිවක් නොමැති නම් ඒ බව සඳහන් කරමින් හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ.

04. තවද, එක් එක් වර්ෂයට අදාල හිඟ ආදායමට අනුරූපීව 2018 වර්ෂයේ මුල් මාස හය තුල රැස්කරන ලද මුදල් පිළිබඳ විස්තර ද එම කාලජේදය තුළදී මු.රෙ.113 පරිදි භාණ්ඩාගාරයෙන් ලද අනුමැතිය ප්‍රකාරව අතහරින ලද ආදායම් වේ නම් ඒ සම්බන්ධ විස්තරද අමුණා ඇති ආකෘති පත්‍ර 02 පරිදි ඉදිරිපත් කළ යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

පද්මසිරි ජයමාන්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

පිටපත් :- 1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

# 2018.06.30 දිනට හිඟ ආදායම් පිළිබඳ වාර්තාව

I. ව්‍යවස්ථාව /අධිකාරිය - ආයතන සංග්‍රය / ඉඩම් සංවර්ධන ආඥා පනත / රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: **10/2018**

II. ව්‍යවස්ථාපිත අධිකාරිය - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

III. ආදායම් අයිතමය - රජයේ ගොඩනැගිලි කුලී

IV. ආදායම් සංකේතාංකය - 20.02.01.01.

| විස්තරය (රජයේ ගොඩනැගිලි කුලී ආදායම් වරගීකරණය) | හිඟ ආදායම් | | | | | හිඟ සඳහා හේතු | හිඟ අයකර ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග | හිඟ අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳ සහතිකය |
|---|---|---|---|---|---|---|---|---|
| | 2015.12.31 දින දක්වා සමුච්චිත හිඟ මුදල රු. | 2016 වසරට අදාල හිඟ මුදල රු. | 2017 වසරට අදාල හිඟ මුදල රු. | 2018.06.30 දින දක්වා හිඟ මුදල රු. | 2018.06.30 දක්වා මුළු හිඟ මුදල (2 +3 + 4 +5) රු. | * | * | * |
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) | (9) |
| i. නිළ නිවාස | | | | | | | | |
| ii. සංචාරක බංගලා හා නිවාඩු නිකේතන | | | | | | | | |
| iii.වෙනත් ගොඩනැගිලි | | | | | | | | |

2017.12.31 දිනට ඉදිරිපත් කළ හිඟ ආදායම් වාර්තාව මගින් ඉහත වගුවේ තීරු අංක 2 සිට 4 දක්වා වාර්තා කරන ලද එක් එක් හිඟ මුදල් වලින් 2018 වර්ෂයේ මුල් මාස 06 දක්වා අයවිම් ඇතොත් ඒවා අඩු කළ පසු ලැබෙන මුදලට මෙම තීරු යටතේ වන එකතුන් සමාන විය යුතුවේ. එසේ නැතහොත් අදාල වෙනස්කම් සඳහා විස්තරාත්මක හේතු ඇමුණුම් ලෙස ඉදිරිපත් කිරීම සුදුසු වේ.

* 7 , 8 සහ 9 තීරු සඳහා වලංගු පැහැදිලි හේතුන් අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය. ඒ සඳහා ආකෘතියේ ඇති ඉඩ ප්‍රමාණවත් නොවේ නම් ඇමුණුමක් ලෙස ඉදිරිපත් කිරීම සුදුසුවේ.

සැ.යු. :- හිඟ ආදායම් දැක්වීමේදී ඉහත වර්ගීකරණය යටතේ ඉදිරිපත් කිරීමට සැලකිලිමත් වන්න.

දිනය - ..............................

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

...............................................................

ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/දිස්ත්‍රික් ලේකම්
(නිල මුද්‍රාව)

# 2018.06.30 දිනට හිඟ ආදායම් එකතු කිරීම් පිළිබඳ සහ අනුමත ආදායම් අතහැරීම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :

ආදායම් සංකේතාංක : **20.02.01.01.**

| විස්තරය | 2018 වර්ෂය තුල හිඟ ආදායම් එකතු කිරීම | | | | * 2018 මුල් මාස 06 තුල හිඟ ආදායම් අත්හැර දැමීම් | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2015.12.31 දින දක්වා හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම් | 2016 වසරට අදාල හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම | 2017 වසරට අදාල හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම | හිඟ මුදලට අදාලව මුළු එකතු කිරීම් (2+3+4) | 2015.12.31 දක්වා | | 2016 | | 2017 | | හිඟ මුදලට අදාලව අත්හැර දැමීම්වල මුළු එකතුව (6+8+10) |
| | | | | | හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | වසරට අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | වසරට අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | |
| | රු. | රු. | රු. | රු. | රු. | | රු. | | රු. | | රු. |
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) | (9) | (10) | (11) | (12) |
| i. නිළ නිවාස | | | | | | | | | | | |
| ii. සංචාරක බංගලා හා නිවාඩු නිකේතන | | | | | | | | | | | |
| iii. වෙනත් ගොඩනැගිලි | | | | | | | | | | | |

* මෙම ආදායම් සංකේතාංකය යටතේ වන යම් කිසි ආදායම් අත්හැර දැමීමක් සඳහා මු.රෙ. 113 ප්‍රකාරව භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ. එබැවින් මේ යටතේ සඳහන් කළ යුත්තේ එසේ භාණ්ඩාගාරයේ (රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව) අධිකාර බලය ලබාගත් අත්හැර දැමීම් වන අතර ඒ සඳහා අදාල එක් එක් බලය දීමේ ලිපියේ පිටපතක් ද මේ සමඟ ඇමිණිය යුතුවේ.

දිනය :- ............................

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

......................................................................

ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/දිස්ත්‍රික් ලේකම්

(නිල මුද්‍රාව)